# සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය
# පුරප්පාඩු

සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ පහත සඳහන් පුරප්පාඩු වී ඇති තනතුරු සඳහා බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් 2025.08.15 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 1. කළමනාකරණ සහකාර (III ශ්‍රේණිය)

සුදුසුකම් :

(I) අ.පො.ස (සා/පෙළ) විභාගයේදී

i. සිංහල භාෂාව/ දෙමළ භාෂාව
ii. ඉංග්‍රීසි භාෂාව/ ඉංග්‍රීසි සාහිත්‍යය
iii. ගණිතය

යන විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයක් (06) එක් වරකදී සමත්ව තිබිය යුතුය.

සහ

(II) අ.පො.ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත්වීම (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර).

- පැරණි නිර්දේශය යටතේ විෂයයන් තුනක් (03) ක් පමණක් සමත්වීම ප්‍රමාණවත් වේ.

(III) පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.

(අ) පිළිගත් ආයතනයකින් ලබාගත් මාස හයකට (06) නොඅඩු පරිගණක යෙදුම් පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක්.

හා

(ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද.

වෙනත් සුදුසුකම් :

(I) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(II) රාජකාරී සඳහා සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍යයක් තිබිය යුතුය.
(III) විශිෂ්ඨ හා සදාචාරසම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

වැටුප් පරිමාණය : UMN 1 (III) රු. 49,475.00 - 17x540 - 58,655.00 (මාසික)
(මීට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම : ලිඛිත පරීක්ෂණය (ලකුණු 75%):

අ. පහත විෂයය ක්ෂේත්‍ර ආවරණය කෙරේ.

(අ) සිංහල/ දෙමළ සහ ඉංග්‍රීසි භාෂා දැනුම
(ආ) බුද්ධි පරීක්ෂණය සහ සාමාන්‍ය දැනුම
(ඇ) පරිගණක සාක්ෂරතාවය

සහ

ආ. සම්මුඛ පරීක්ෂණය (ලකුණු 25%)

- විභාග ප්‍රශ්න පත්‍රයේ සිංහල හා ඉංග්‍රීසි භාෂා දෙකෙන්ම ප්‍රශ්න ඇතුලත් වේ.

වයස : වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 30ට නොවැඩි.

**2.** වැඩ සහායක (III ශ්‍රේණිය)

**3.** ආරක්ෂක නියාමක (III ශ්‍රේණිය)

සටහන: ඉහත අංක 2 හා 3 තනතුරු සඳහා;

සුදුසුකම් :

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයක් (06) සමත් වී තිබීම හා අඩුම වශයෙන් විෂයයන් දෙකකට (02) සම්මාන සාමාර්ථ තිබීම.

වෙනත් සුදුසුකම් :

(I) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(II) රාජකාරී සඳහා සුදුසු ශාරීරික හා මානසික සෞඛ්‍යයක් තිබිය යුතුය.
(III) විශිෂ්ඨ හා සදාචාරසම්පන්න චරිතයකින් යුක්ත විය යුතුය.

වැටුප් පරිමාණය : UPL 1(III) - රු. 42,775.00 - 16x450 - 49,975.00 (මාසික)
(මීට අමතරව රජය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත වෙනත් දීමනාද ගෙවනු ලැබේ.)

බඳවා ගැනීම : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හා/ හෝ වෘත්තීය පරීක්ෂණයක් මඟින්

වයස : වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45ට නොවැඩි.

**අයදුම්පත් ක්‍රියාපරිපාටිය:**

01. අයදුම්පත් විශ්වවිද්‍යාලයේ වෙබ් අඩවිය වන www.vpa.ac.lk වෙතින් බාගත කරගත යුතු අතර නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත **"ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන ආයතන අංශය, සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය, නො. 21, ඇල්බට් චන්ද්‍රවංකය, කොළඹ 07"** යන ලිපිනයට 2025.08.15 ප.ව. 4.00 ට පෙර ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය. අයදුම්පත බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන ලද තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු වේ.

02. අදාළ සහතිකවල පිටපත් අයදුම්කරු විසින් සහතික කර අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුයි.

03. ඉහත වෙබ් අඩවියෙන් බාගත කරන ලද ආකෘති පත්‍රය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් පමණක් සළකා බලනු ලබන අතර අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලි වීම, අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම, සුදුසුකම් හා පළපුරුද්ද සඳහන් නොකිරීම හා අදාළ සහතිකවල ඡායා පිටපත් අමුණා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතු වේ.

04. රාජ්‍ය සේවයේ හෝ සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ අංශ ප්‍රධාන මඟින් එවිය යුතුය.

05. කිසියම් හේතුවක් මත යම් අයදුම්පතක් ප්‍රතික්ෂේප වුවහොත් එම අයදුම්පත නැවත සළකා නොබැලේ.

06. විශ්වවිද්‍යාලයේ භාවිතා වන රාජකාරීමය භාෂා මාධ්‍යයන් සිංහල හා ඉංග්‍රීසි වේ.

**ලේඛකාධිකාරී**
**සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය**
**නො.21, ඇල්බට් චන්ද්‍රවංකය**
**කොළඹ 07**
2025.07.24